14

Article 12(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date | 2018.2-19 |
|---|---|---|---|

පැමිණිලිකරු : ජේ.අයි දිසානායක මයා.
තම්මැන්නාව.
පහළ මාරගහවැව.

වගඋත්තරකරුවන් : මානව සම්පත් කළමණාකරු.
ඛණිජ තෙල් නීතිගත සංස්ථාව.
අංක : 601. දොස්තර ස්ටැන්ලි ද සිල්වා මාවත.
කොළඹ 09.

<u>පැමිණිලි අංකය</u> : **<u>HRC/AP/460/2014</u>**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ. තමා 1999 වර්ෂයේදී අපරාධ විද්‍යාව හා අපරාධ යුක්තිය පිළිබඳ ගෞරව උපාධියත්. පන්ති සාමාර්ථයක් ද සමඟ ලබා ඇති අයකු බවත් එම පරීක්ෂණයෙන් A-7 විධායක සහකාර තනතුර සඳහා තොරාගෙන පත්වීම් ලිපි ප්‍රධානයේදී B-3 ලිපිකරු තනතුරක් ලබා දී ඇති බවයි.

එසේ වුවද එම අවස්ථාවේදී තමන් B-3 ශ්‍රේණියේ ලිපිකරු පත්වීමක් භාරගත් බවත්. 2000 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා උසස්වීම් සඳහා කිසිදු අයදුම්පත්‍ර කැඳවීමක් නොකළ බවත් 2006 වර්ෂයේ පැවැති ඌන සේවා උපාධිධාරිනියන් විධායක තනතුරට පුහුණු කිරීමේ වැඩ සටහනට අනුව හා සංස්ථා උපාධිධාරින් පවරන ලද නඩුවකට අනුව සියළුම උපාධිධාරීන්ට උසස්වීම් පිරිනැමීමට කටයුතු සිදුවූ බවත්. ඒ අනුව B – 3 සිට B -1 දක්වා උසස්වීම් ලද බවත්ය.

එමෙන්ම උපාධිධාරීන් විධායක කටයුතු සඳහා පුහුණු කිරීමට අදාළ පූර්ණ කාලීනව පුහුණුවක්ද පැමිණිලිකාරිය විසින් ලබා ගත් බවත්. එමෙන්ම පැමිණිලිකාරිය අදාළ පුහුණුව අවසන් කර වසර 08ක පමණ කාලයක් අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලයේ සේවය කරන බවත්. මෙතෙක් කිසිදු උසස්වීමක් සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වා නොමැති බවත්. ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04.<br>14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.<br>14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති<br>தவிசாளர்<br>Chairperson | 011-2505451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2505541/74 | ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail | sechrc@sltnet.lk |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94 -11- 2505580/81/82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2505521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 011-2505575<br>1996 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

අලෙවි කාර්යාංශයේ පුරප්පාඩු වන තනතුරු සඳහා පත්කිරීම් කළමණාකාරීත්වයේ අභිමතය පරිදි සිදුවන බවත් මෙමඟින් අසාධාරණයක් සිදුවන බවත් දක්වා ඇත.

කරුණු මෙසේ තිබියදී නුගේගොඩ ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය පරිපාලකවරයෙක් ලෙස සේවය කරන එනම් B-1 ශ්‍රේණියේ අයෙකු වන කේ.ඕ.එන්.ඩී චන්ද්‍රසේන යන අයව 2014.07.17 වන දින උතුරු මැද ප්‍රාදේශීය කාර්යාලය වෙත A-6 ශ්‍රේණියේ පුරප්පාඩු වූ තනතුර පිරවීම සඳහා පත්කර එවා ඇති බවත්. මෙමඟින් වසර 15 ක් සංස්ථා සේවයේ නියුක්තව සිටින හා අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලයේ පුරප්පාඩු වන තනතුරක් ලබා ගැනීම සඳහා අපේක්ෂාවෙන් සිටින පැමිණිලිකාරියට අසාධාරණයක් සිදුව ඇති බවත් දක්වා ඇත.

වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-

වගඋත්තරකරු පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු දක්වමින් සඳහන් කර ඇත්තේ. 200.07.12 වන දින පැමිණිලිකාරිය විසින් සම්පූර්ණ කර ඇති B-3 ශ්‍රේණියේ ලිපිකරු අයදුම් පත්‍රයට අනුව 2000.07.19 දින B- 3 ශ්‍රේණියේ ලිපිකරු පත්වීම ලබා දී ඇති බවත් ඒ අනුව ප්‍රතිඥාව ලබා දී ඇති බවත්ය.

සංස්ථාවේ විධායක නොවන තනතුරුවලට බඳවාගෙන ඇති උපාධිධාරීන් 48 දෙනකු විධායක තනතුරුවලට උසස් කරන ලෙසට ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක SCFR/172/2006 දරණ නඩුව සංස්ථාවට එරෙහිව පවරා තිබූ බවත්. ඒ අනුව උපාධිය සම්පූර්ණ කර ඇති සියළුම අයට සහනයක් සැළසීම සඳහා වසරක පුහුණුවක් ලබා දී සංස්ථාවේ බඳවා ගැනීම් හා උසස්වීම් ක්‍රියාපටිපාටියට අනුකූලව විධායක තනතුරුවලට ඇතිවන අභ්‍යන්තර පුරප්පාඩු සඳහා අයදුම්කර උසස්වීම් ලබා ගැනීමට හැකි වන පරිදි මෙම උපාධිධාරීන් අවම B-2 ශ්‍රේණියට උපරිමය A-7 ශ්‍රේණිය දක්වා දැනට සිටින ශ්‍රේණියේ සිට එකවර උසස්වීම් දෙකක් ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර ඇති බවත්. ඒ අනුව මෙම පැමිණිලිකාරිය 2007.01.01 සිට B - 1 ශ්‍රේණියට උපාධිධාරී අභ්‍යාසලාභී තනතුරට එකවර උසස්වීම් ලබාගෙන ඇති බවට දක්වා ඇත.

සංස්ථාවේ පිරිස් බල සැලැස්මට අනුව ඉදිරියේදී ඇතිවන පුරප්පාඩු සඳහා අභ්‍යන්තරික නිවේදන අනුව සුදුසුකම් මත අයදුම් කිරීමෙන් පසු සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිට විධායක තනතුරු සඳහා උසස්වීම් ලබා ගැනීමට හැකියාව ඇති බවත්. එමෙන්ම අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලයේ වැඩබැලීම සඳහා තාවකාලිකව පත්කර ඇති නිලධාරියා පත්කර ඇත්තේ. කාර්යාංශ ප්‍රධානියාගේ නිර්දේශ හා සේවා අවශ්‍යතාවය මත බවත්. වැඩ බැලීම හේතුවෙන් අදාළ අයට එම නිත්‍ය තනතුරේ හිමිකම් නොලැබෙන බවත් වගඋත්තරකරුවන් විසින් සඳහන් කර ඇත.

වගඋත්තරකරුගේ වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පැමිණිලිකාරිය විරෝධතා දක්වා ඇති බැවින් පාර්ශවයන් කැඳවා 2015.06.19 වන දින කොමිෂන් සභාවේදී පරීක්ෂණයක් සිදුකර ඇති අතර එම පරීක්ෂණය සඳහා මානව සම්පත් කළමණාකරු කොමිෂන් සභාව හමුවේ පෙනී සිට ඇත.

අදාළ පරීක්ෂණයේදී මානව සම්පත් කළමණාකරු කොමිසම වෙත ප්‍රකාශ කර ඇත්තේ සංස්ථාවේ පුරප්පාඩු පවතින A-7 ශ්‍රේණියේ උසස්වීම් ලබා දීම සඳහා අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට ඇති අවස්ථාව හැකි ඉක්මනින් පැමිණිලිකාරිය වෙත ලබා දීමට අවශ්‍ය කටයුතු කරන බවයි.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකාරිය ප්‍රධාන කොටම තම පැමිණිල්ල මගින් සඳහන් කර ඇත්තේ. තමන් ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ B- 1 ශ්‍රේණියේ ලිපිකාරිනියක ලෙස 2000.07.17 දින සිට සේවය කරන බවත්. 2007.01.01 B - 1 ශ්‍රේණිය ලද බවත් තම ඊලඟ උසස්වීම A -7 විධායක තනතුර බවත් අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලයේ A- 7 තනතුර පුරප්පාඩු ඇති බවත් එම තනතුර සඳහා අයදුම්පත් නොකැඳවා සම්මුඛ පරීක්ෂණ නොපවත්වා තමාට වඩා අඩු සුදුසුකම් ඇති අයකු වැඩ ආවරණය කිරිම සඳහා පරිපාලනයේ අභිමතය පරිදි පත් කිරිම තුළින් අසාධාරණයක් සිදුව ඇති බවත්ය.

වගඋත්තරකරු මේ සම්බන්ධයෙන් ප්‍රකාශ කර ඇත්තේ. පිරිස්බල සැකැස්මේ විධායක තනතුරුවල පුරප්පාඩුක් ඇති වූ පසු අභයන්තරිකව ඒ සඳහා අයදුම්පත් කැඳවන බවත්. එසේ අයදුම්පත් කැඳවූ පසු අයදුම් කර ඒ සඳහා ඉදිරිපත් විය හැකි බවත්. ඒ අනුව මෙතෙක් පැමිණිලිකාරියට අසාධාරණයක් සිදුකර නොමැති බවත්ය.

පැමිණිලිකාරිය 2000.07.17 දින B-3 ලිපිකාරිනියක ලෙස සංස්ථාවේ සේවයට බැඳී 2007.01.01 සිට B -1 ශ්‍රේණිය ලබා මෙතෙක් එම තනතුරේ සේවය කරනු ලබන බව පාර්ශව විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති ලේඛන අනුව නිරීක්ෂණය වේ.

පාර්ශව විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති කරුණු අනුව සංස්ථාවේ විධායක නොවන තනතුර වලට බඳවා ගත් උපාධිධාරීන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනුකර ඇති නඩුවකට අනුව මෙම පැමිණිලිකාරිය ඇතුළු සංස්ථාවේ සේවයේ නියුතු සියළුම උපාධිධාරීන්ට සංස්ථාවේ බඳවා ගැනීම් හා උසස් කිරීමේ ක්‍රියා පටිපාටියට අනුකූලව විධායක තනතුරුවල ඇති වන අභ්‍යන්තර පුරප්පාඩු සඳහා අයදුම්කර උසස්වීම් ලබා ගැනීමට හැකිවන පරිදි වසරක පුහුණුවක් ලබා දීමට සංස්ථාව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය වෙත එකඟ වී ඇති බව නිරීක්ෂණය වන අතර. එම එකඟතාවය මත පැමිණිලිකාරිය ඇතුළු උපාධිධාරීන්ට වසරක පුහුණුවක්ද ලබා දී ඇති බවද නිරීක්ෂණය වේ.

පාර්ශව විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති ලේඛන අනුව පැමිණිලිකාරිය 2007 වසර B - 1 ශ්‍රේණියට පත්ව ඇති බැවින් සංස්ථාවේ බඳවා ගැනීමේ පරිපාටිය අනුව B - 1 ශ්‍රේණියේ අවුරුදු 07 ක් සේවය කිරීමෙන් පසු A - 7 තනතුරේ ඇතිවන පුරප්පාඩු සඳහා අයදුම් කිරීමේ අවස්ථාව හිමි වේ.

කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වී ඇති කරුණු අනුව A- 7 ශ්‍රේණියේ පුරප්පාඩු 9 ක් (උතුරුමැද පළාත ඇතුළුව) පවතින බව නිරික්ෂණය වන අතර. එම පුරප්පාඩුව සඳහා වැඩ බලන නිලධාරීන් පත්කර ඇති බවද නිරික්ෂණය වේ.

බඳවා ගැනීමේ පටිපාටිය අනුව මේ වන විට පැමිණිලිකාරිය B-1 ශ්‍රේණියේ වසර 09 සම්පූර්ණ කරමින් හා උපාධිය සමඟ B - 1 ශ්‍රේණිය වසර 09 ක් සම්පූර්ණ කර ඇති බැවින් පැමිණිලිකාරියට A- 7 ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සඳහා ඉල්ලුම් කිරීමේ සුදුසුකම ඇති බව නිරික්ෂණය වේ.

නමුත් සංස්ථාව විසින් A - 7 ශ්‍රේණියේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත්‍ර කැඳවීමක් සිදුකර නොමැති බව නිරික්ෂණය වන අතර. කොමිෂන් සභාව ඉදිරියේ පැවැති එකඟතාවය මත අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලයේ පවතින A - 7 පුරප්පාඩුව පිරවීම සඳහා අයදුම්පත්‍ර කැඳවීමට එකඟ වී ඒ අනුව 2015.09.30 දින අභ්‍යන්තර නිවේදනයක් නිකුත් කර ඇති බව දන්වා ඇතත් මේ දක්වා එම නිවේදනය අනුවද කටයුතු කර නොමැති බව නිරික්ෂණය වේ.

ඒ අනුව පවතින A - 7 පුරප්පාඩු පිරවීම සඳහා අභ්‍යන්තර අයදුම්කරුවන්ට අයදුම්පත්‍ර ඉදිරිපත් කිරිමට සංස්ථාව ඉඩ ලබා නොදීමෙන් සුදුසුකම් සපුරා සිටින පැමිණිලිකාරිය ඇතුළු අභ්‍යන්තර අයදුම්කරුවන්ට අසාධාරණයක් සිදුව ඇති බව නිරික්ෂණය වේ.

එමෙන්ම අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලයේ A - 7 තනතුරේ පුරප්පාඩු පවතින බව වගඋත්තරකරුවන් පිළිගෙන ඇති අතර. එම කාර්යාලයේදී අදාළ තනතුරේ පවතින පුරප්පාඩුවේ වැඩ ආවරණය කිරීම සඳහා පැමිණිලිකාරිය සුදුසුකම් සම්පූර්ණ කර ඇති බව වගඋත්තරකරුවන් විසින් දැන සිටියදී එම තනතුරේ වැඩ ආවරණය කිරීම සඳහා ප්‍රාදේශිකයෙන් පිටත නිලධාරියෙකු ඒ සඳහා යොදවා ඇති බවද නිරික්ෂණය වන අතර එමඟින් ද පැමිණිලිකාරියට අගතියක් සිදුවන ආකාරයට වගඋත්තරකරුවන් කටයුතු කර ඇති බවද නිරික්ෂණය වේ.

ඉදිරිපත්ව ඇති සියළු කරුණු අනුව සංස්ථාවේ පුරප්පාඩුව පවතින A-7 තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා අදාළ බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් කරුණු අනුව කටයුතු නොකර ඒ සඳහා සංස්ථාවේ පරිපාලනයේ අභිමතය පරිදි වැඩබැලීම සඳහා නිලධාරීන් පත්කරමින් තනතුරට ස්ථිර නිලධාරියෙකු පත්කිරීම හිතාමතාම මග හරිමින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) හි සඳහන් මූලික අයිතිවාසිකම පැමිණිලිකාරිය සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය ප්‍රකාරව පැමිණිලිකාරියට සහ ඇය හා සමාන සෙසු නිලධාරීන් හට අදාළ ශ්‍රේණියට අයදුම් කිරිමට අවස්ථාවක් සලසා

දෙන ලෙසත්. ඒ අනුව ඔවුන් සුදුසුකම් සපුරන්නේ නම් පත්වීම් ලබා දීමට කටයුතු කරන ලෙසත් මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2018.09 . 20 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
B/
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.